MT - 237/2001-46030/2000.

# ග්‍රීන්පාත් නව නගර ශාලාව වෙන්කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය

නාගරික කොමසාරිස්,
මහ නගර සභාව
කොළඹ 07.

1. අයදුම්කරුගේ නම : ......................................................................................................
2. ලිපිනය : ......................................................................................................
3. ශාලාව අවශ්‍ය දිනයන් සහ වේලාවන් : ......................................................................................................
4. ශාලාව අවශ්‍ය කාරණය : ......................................................................................................
5. ජාතික හැඳුනුම්පත් අංක : ......................................................................................................
6. දුරකථන අංකය : ......................................................................................................

නව නගර ශාලාව පාවිච්චිය වෙනුවෙන් බල පැවැත්වෙන සියළු කොන්දේසි සහ රෙගුලාසි අනුගමනය කරන බවටත්, ඉහත සඳහන් කාල සීමාව ඉක්මවා ශාලාව පාවිච්චි කරනු ලැබුවහොත් එසේ වැඩිපුර පාවිච්චි කල කාලසීමාවන්ට අදාල අතිරේක ගාස්තු ගෙවන බවටත්, ශාලාවට අයත් දේපලවලට කිසියම් හානියක් සිදුවුවහොත් ඒ වෙනුවෙන් වන්දි ගෙවීමටත් මෙයින් පොරොන්දු වෙමි.

.................................................
අයදුම්කරුගේ අත්සන.

දිනය : .................................................

**ගාස්තු චක්‍රය**

| | සංදර්ශන සහ වෙනත් උත්සව | දේශපාලන රැස්වීම (පිළිගත් දේශපාලන පක්ෂයක් සඳහා වසරකට එක් වරක් පමණි) |
|---|---|---|
| 01. (අ) එක්දිනකට (පෙරවරු 8.00 සිට පස්වරු 18.00 දක්වා) | 15,000.00+ භාණ්ඩ හා සේවා බදු | 5,000.00+ භාණ්ඩ හා සේවා බදු |
| (ආ) වරුවක් (පෙරුවරු 8.00 සිට පස්වරු 14.00 දක්වා හෝ පස්වරු 15.00 සිට පස්වරු 21.00 දක්වා) | 10,000.00+ භාණ්ඩ හා සේවා බදු | 2,500.00+ භාණ්ඩ හා සේවා බදු |
| (ඇ) අතිරේක කාලය - ශාලාව පාවිච්චි කරන අතිරේක පැයකට හෝ ඉන් කොටසකට | 3,000.00+ භාණ්ඩ හා සේවා බදු | 1,000.00+ භාණ්ඩ හා සේවා බදු |

**තැන්පතු මුදල**

| | | |
|---|---|---|
| 02. එක් දිනකට හෝ ඉන් කොටසකට | 10,000.00 | 5,000.00 |

**කොන්දේසි :**

**අවලංගු කිරීම හෝ කල් දැමීම**

i. දින 7 ක දැනුම්දීමක් නොමැති නම් කිසිම මුදලක් ආපසු ගෙවීම හෝ කල්දීමක් සිදු නොකෙර්.

ii. දින 7 ක දැනුම්දීමක් සහිතව අවලංගු කිරීමක් හෝ කල්දීමක් වෙනුවෙන් සම්පූර්ණ ගාස්තුවෙන් 25% ක දෙපාර්තමේන්තු ගාස්තුවක් ගෙවිය යුතුය.

කුලී මුදල :............................ රු :........................ ලදුපත් අංකය/දිනය :.............................

තැන්පත් මුදල :........................ රු :........................ ලදුපත් අංකය/දිනය :.............................

iii. ශාලාවේ ඇතුලත හා පිට ඇන ගැසීම, කිසියම් පුවරු සවි කිරීම, දැන්වීම් ඇලවීම හෝ පින්තාරු කිරීම් වැනි දෑ සම්පූර්ණයෙන්ම තහනම් වේ.

## කොළඹ මහ නගර සභාව

# නව නගර ශාලා රඟහල කුලියට දීමට අදාල කොන්දේසි හා නීතිරීති මාලාව

**(මෙම නීතිරීති 2001 අප්‍රේල් මස 26 වැනි දින සිට බලපැවැත්වේ)**

---

01. කොළඹ මහ නගර සභාවට අයත් ඉහත සඳහන් රංගශාලා කුලියට දෙනු ලබන්නේ ප්‍රසාංගික කලා හා සම්මන්ත්‍රණ, උත්සව සහ දේශපාලන රැස්වීම් සඳහා පමණකි. අදාල කුලී මුදල් හා තැන්පත් මුදල් සම්පූර්ණයෙන් ගෙවිය යුතු වේ.

02. තැන්පත් මුදල අවසන් වී (දින 14 ක්) දෙසතියක් ගත වූ පසුව කුලියට ගත් කාලය තුල රඟහලේ උපකරණ හෝ දේපලවලට අලාභයක් සිදු වී ඇත්නම් එය පියවාගෙන ඉතිරි මුදල ආපසු ගෙවනු ලැබේ. ඒ සඳහා නිල කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය. තවද විදුලි පාවිච්චිය පිළිබඳ සේවා ගාස්තුවක් අය කරනු ලැබේ. (චෙක්පත් මගින් ගෙවීම් කරනු ලබන්නේ නම් අදල බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ චෙක්පත උපලබ්ධිවූ පසුවය)

03. රඟහල වෙන් කරවා ගැනීමේදී හෝ දර්ශන පැවැත්වීමට දින 03 කට පෙර අදල නාට්‍යයේ, සංදර්ශනයේ හෝ ප්‍රසංගයේ හෝ නිර්මාණ අධ්‍යක්ෂවරයාගේ කැමැත්ත පල කරන ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

04. වේදිකාගත කරන නාට්‍යයේ හෝ චිත්‍රපටයට අදල ප්‍රසිද්ධ රැඟුම් පාලන මණ්ඩලය විසින් නිකුත් කරන අවසර පත්‍රය රංග ශාලාව පාවිච්චියට ගනු ලබන දිනට දින 7 කට කලින් අනිවාර්යයෙන්ම ලබාදිය යුතුය.

05. දර්ශනය වේදිකාගත කරන දිනයේ දී රඟහල විවෘත කරනු ලබන්නේ කොළඹ මහ නගර සභාව වෙත ගෙවිය යුතු ප්‍රදර්ශන බලපත්‍ර ගාස්තුව ගෙවූ බවට රඟහල් කළමනාකරු වෙත කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසුවය. ඒ සමගම ඉහත අංක 03 සහ 04 යටතේ සඳහන් ලිපි ද ඉදිරිපත් කළ යුතුය.

06. රඟහල වෙන්කරවා ගැනීමෙන් පසුව කිසියම් දුෂ්කරතාවයක් නිසා එම වෙන්කිරීම අවලංගු කිරීමක් හෝ එම දිනය වෙනුවෙන් වෙනත් දිනයක් වෙන්කරවා ගැනීමට අවශ්‍ය නම් රඟහල කුලියට ගැනීමට අදල වන දිනට දින 7 කට පෙර ප්‍රධාන කාර්යාලය වෙත ලිඛිතව දැනුම් දිය යුතුය. නියමිත කාලය තුල දැනුම් දීම සිදු නොකොලහොත් ගෙවන ලද මුදල ආපසු ගෙවනු නොලැබේ. නියමිත කාලය තුල දැනුම් දුන් විට සම්පූර්ණ ශාලා ගාස්තුවෙන් සියයට විසි පහක (25%) මුදලක් අඩුකර ඉතිරි මුදල පමණක් ආපසු ගෙවනු ලැබේ. කෙසේ වෙතත් වෙනත් දිනයක් ලබා ගැනීමට හැකිවන්නේ වෙන් කල දින සිට දින 7 ක් ඇතුලත කාලයක් සඳහා පමණී.

07. රඟහලේ සවිකොට ඇති ස්ථිර ලාම්පු කට්ටලයට අමතරව විදුලි ලාම්පු අවශ්‍ය වන්නේ නම් හා විශේෂ රංගාලෝක උපකරණ යොදා ගන්නේ නම් එම අමතර ලාම්පුවලට අදල මුදල නාගරික භාණ්ඩාගාරික වෙත ගෙවා කුවිතාන්සියක් ලබා ගත යුතුය.

08. රඟහල් පරිශ්‍රය තුල මත්පැන් පානය සපුරා තහනම් වේ.

09. රඟහල ඇතුලත දුම්බීම සපුරා තහනම් වේ.

10. රඟහල තුලට ගිනි අවි, පුපුරණ ද්‍රව්‍ය හා වෙනත් අවි ආයුධ රැගෙන ඒම සපුරා තහනම් වේ.

11. ශාලාව කුලියට ගනු ලබන්නා හෝ නියෝජිතයන් හෝ දර්ශනයට සම්බන්ධ වෙනත් කිසිවකු විසින් නව නගර ශාලාවට අයත් ගෘහ භාණ්ඩ, මෙවලම්, සවිකරන හෝ කිසිදු දේපලකට මොනම අන්දමේ හෝ අලාභයක් සිදු නොකරන බවට රඟහල කුලියට ගනු ලබන්නා වග බලා ගත යුතුය. ඔහුගේ අනුදැනුම ඇතිව හෝ නැතිව ඉහත ආකාරයේ කිසියම් අලාභයක් සිදු වූ විට ඒ සඳහා වූ අදළ අලාභය හෝ වන්දිය ශාලාව කුලියට ගත් අය ගෙවිය යුතුය.

12. ස්ත්‍රී/ පුරුෂ දෙපක්ෂය සඳහා වෙන්කොට ඇති ඇඳුම් අඳින කාමර ( නෙපථ්‍යාගාර) ඒ අයුරින් වෙන් වෙන්ව පාවිච්චි කල යුතුය.

13. දර්ශනය වෙනුවෙන් නිකුත් කරනු ලබන අවසර පත් සංඛ්‍යාව ශාලාවේ ඇති ආසන සංඛ්‍යාව ඉක්මවා නොයන බවට ශාලාව කුලියට ගනු ලබන්නා සහතික විය යුතුය.

14. නාට්‍ය දර්ශන සඳහා බෞද්ධ භික්ෂූන් වහන්සේලා වැඩමකර සිටියහොත් ඒ සඳහා විශේෂිත සුදුසු ආසන වෙන්කරදීම කුලියට ගනු ලබන අයගේ වගකීම වේ.

15. දර්ශනය අවසාන වී පැය දෙකක් ඇතුලත ශාලාව කුලියට ගනු ලබන්නා විසින් දර්ශනය සඳහා රැගෙන ආ සියලු ද්‍රව්‍ය රඟහල භූමියෙන් පිටතට ගෙන යා යුතුය. එසේ ඉවත්කර ගනු නොලැබුවහොත් අමතර පැය ගණන සඳහා අමතර ගාස්තු ගෙවිය යුතුව ඇත.

16. කොළඹ මහ නගර සභාවට අයත් රඟහල් යම්කිසි දර්ශනයක් සඳහා වෙන්කොට ඇති අවස්ථාවකදී කිසියම් කරුණු පැහැදිලි කිරීමකින් තොරව නාගරික කොමසාරිස් ගේ අභිමතය පරිදි එම වෙන්කිරීම අවලංගු කිරීමේ බලතල නාගරික කොමසාරිස් වෙත ඇති බව වෙන්කර ගනු ලබන්නා විසින් විශේෂයෙන් දැනගත යුතු වේ. එබඳු අවලංගු කිරීමක් පිළිබඳව කිසිදු ආලාභයක් හෝ පාඩුවක් නගර සභාවෙන් හෝ ඉල්ලා සිටීමට හෝ ශාලාව කුලියට ගන්නා කිසිවෙකුටත් අයිතිවාසිකමක් නොමැත. එමෙන්ම තෙවන පාර්ශවකරුවකු විසින් කරන එවැනි අලාභ ඉල්ලීමකින් නගර සභාව නිදහස් කිරීමටද ශාලා කුලියට ගන්නා තැනැත්තා බැඳී සිටී.

17. මෙහි සඳහන් කවර කොන්දේසියක් වුවද සංශෝධනය කිරීමට/ අවලංගු කිරීමට හෝ ඉවත් කිරීමට නගර සභාවට බලය ඇත.

18. නාට්‍ය දර්ශන පැවැත්වෙන අවස්ථාවේදී වීඩියෝ කැමරා මගින් රූපගත කිරීමට අවසර දෙනු නොලැබේ. කෙසේ වුවද ප්‍රේක්ෂකයන් රැස්වීමට පෙර නාගරික කොමසාරිස්වරයාගේ අවසරය ලබා ඇත්නම් නියමිත ගාස්තු ගෙවා වීඩියෝ ගත කිරීමට ඉඩ දෙනු ලැබේ.

19. ශබ්ද විකාශන පද්ධතිය අන් අයට හිරිහැරයක් නොවන පරිදි පාලනය කලයුතු අතර, එය ................................ ට නොවැඩි විය යුතුය.

20. ඉහත සඳහන් කොන්දේසි උල්ලංඝනය කරනු ලැබුවහොත් නීත්‍යානුකූලව පියවර ගනු ලබන අතර, අසාධු ලේඛනයට ද ඔවුන්ගෙ නම් ඇතුලත් කරනු ලබන අතර, ඉන්පසු එවැනි අයට රඟහල වෙන් කරදීම අත්හිටුවනු ලැබේ.

---

ඉහත සඳහන් කොන්දේසි හොඳින් කියවා බලා තේරුම් ගත් බවත්, එම කොන්දේසි හා නීතිරීතිවලට යටත්ව රඟහල කුලියට ගැනීමට එකඟ වන බවත් මෙහි පහත අත්සන් තබා සහතික කරමි.

......................................... ..................................................

*දිනය* *අයදුම්කරුගේ අත්සන*